කෙටුම්පත
ජෛවවිවිධත්වය හා බැඳුණු පාරම්පරික දැනුම හා ව්‍යවහාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග

**2. 2020…………**

**3. හැඳින්වීම**

## I. පසුබිම

පෞරාණික සංස්කෘතියකට සාක්ෂි සපයන්නා වූ වසර 2500 කට අධික වංශකථාමය ඉතිහාසයක් සහිත ශ්‍රී ලංකාව, සංරක්ෂණය, ආරක්ෂාව, ප්‍රවර්ධනය, වර්ධනය, වලංගු කිරීම හා අනුකලනය කිරීම ආදියට සුදුසු පාරම්පරික දැනුම් පද්ධතීන් සහ සාම්ප්‍රදායික සංස්කෘතික ප්‍රකාශනයන් ගෙන් පොහොසත් මෙන් ම සමෘද්ධිමත් වූ රටක් ලෙස සැලකිය හැකි ය.

යම් නිශ්චිත භූගෝලීය සීමාවන් තුළ හෝ ප්‍රදේශයක ජීවත්වන ජනතාව, සිය සාම්ප්‍රදායික හා උපඥාන මගින් දරා සිටින දැනුම් සම්භාරය එකී භූගෝලීය සීමාවලින් දැක්වෙන ප්‍රදේශයන්ට සහ ජනතාවට හෝ යම් ප්‍රජා කණ්ඩායමකට අයත් දැනුම පාරම්පරික දැනුම වේ. යම්කිසි කාර්යක් සඳහා ඍජුව හෝ වක්‍රව, පූර්ණව හෝ අර්ධ ලෙස පාරම්පරික දැනුම ස්පර්ශ හෝ අස්පර්ශ නිපැයුමක් හෝ එවැනි ප්‍රශස්ත නිපැයුමකට මගපෙන්වීමක් සඳහා යොදාගැනීම ව්‍යවහාරය වේ. ශ්‍රී ලංකාවේ පාරම්පරික දැනුම කාලගුණික, කෘෂිකාර්මික, වාරිමාර්ග, ජෛවවිවිධත්ව සංරක්ෂණය හා තිරසර භාවිතය වැනි විවිධ ක්ෂේත්‍ර ආවරණය කරයි.

ලෝකයේ රටවල් අතුරින් ශ්‍රී ලංකාව ඉතා දිගු ශිෂ්ටාචාරයක් මගින් සංස්කෘතියත් සභ්‍යත්වයත් රැගෙන ආ එක් සුවිශේෂ දිවයිනකි. මෙම අඛණ්ඩ සංස්කෘතියට වරින් වර පැමිණි විදේශ ආක්‍රමණ නිසා යම් යම් බලපෑම් ඇති වුවද 15 වන හා 16 වන සියවස දක්වා එය අඛණ්ඩව ගලායන ලදී. වර්තමානයේ දී පවා දිවයිනේ ඈත පිටිසර පළාත්වල ජනතාව විසින් දේශියත්වය සහ ඒ හා බැඳුණු පාරම්පරික දැනුම හා ව්‍යවහාරයන් මහත් ලැදිකමින් ආරක්ෂා කරගනිමින් භාවිත කරයි.

බටහිර තාක්ෂණික හා සංස්කෘතික ආක්‍රමණවල බලපෑම් නිසා පාරම්පරික දැනුම හා බැඳුණු සාධක බොහෝමයක් අඩුවැඩි වශයෙන් පරිහාණියට පත් ව ඇත. එතෙක් කල් මනා සම්බන්ධතාවක් පැවති පාරම්පරික දැනුම සහ ඒ හා සම්බන්ධ දේශීය සම්පත් භාවිතය පැහැර හැරීම ස්වභාවික සම්පත් කෙරෙහි ඉතා අහිතකර ලෙස බලපා ඇත.

## II. ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව

ශ්‍රී ලංකාව පාර්ශ්වකාර රාජ්‍යයක් වූ ජෛවවිවිධත්ව සම්මුතියේ 8 (ජේ) වගන්තියෙන් පාරම්පරික ජනතාව ගේ ජීවන රටාව පෝෂණය කිරීම සඳහා හා පාරම්පරික දැනුම සංරක්ෂණය කර භාවිත කිරීම සඳහා පාර්ශ්වකාර රාජ්‍යයන් බැඳී සිටිය යුතු බව සඳහන් වේ. ජෛවවිවිධත්වය හා බැඳුණු පාරම්පරික දැනුම හා ව්‍යවහාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සැකසීමේදී මේ පිළිබඳව අවධානය යොමු කර ඇත. එසේ ම පාරම්පරික දැනුමට අදාළ වෙනත් අන්තර්ජාතික සම්මුතීන් හා සන්ධාන සඳහා ද, ඉදිරියේ දී අදාළ විෂය හා සම්බන්ධව ඇති වන සන්ධාන සඳහා ද මෙය ප්‍රතිපාදන සපයයි.

ජෛවවිවිධත්වයෙන් පොහොසත් රටවල් සතු සුවිශේෂ පාරම්පරික දැනුම හා ව්‍යවහාර පිළිබඳ අගය වටහා ගෙන ඇති ලොව ප්‍රබල රටවල්, දැනට නීත්‍යානුකූල නොවන මාර්ගවලින් පවා එය ලබා ගැනීමේ වෑයමක නිරත වී සිටී. එමෙන් ම පාරම්පරික දැනුම හා ව්‍යවහාර ක්‍රමයෙන් වියැකීයාමේ අවදානමක් සහිත ශ්‍රී ලංකාව වැනි රටක දේශිය සම්පත්වල භාවිතය ද පිරිහීමකට ලක් ව ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස අප සතු සුවිශේෂ පාරම්පරික දැනුමෙහි ප්‍රතිලාභ, අයිතිවාසිකම් බලපත්‍ර මගින් වෙනත් දියුණු රටවල් ලබාගන්නා අතර දේශිය සම්පත් භාවිතය පිරිහීමෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය පසුබෑමකට ලක් ව ඇත. විශේෂයෙන් ම පාරම්පරික දැනුම පරම්පරාවෙන් පරම්පරාවට උරුම වීමේ සාම්ප්‍රදායික විධික්‍රමය දුර්වල වීම එම දැනුම වියැකීයාමට බලපෑ තවත් ප්‍රධාන සාධකයක් වේ.

ජාතික අවශ්‍යතා සඳහා පාරම්පරික දැනුම ආරක්ෂා සහිත ව භාවිත කිරීමට ඇති අවකාශයන්හි මඳ බව සහ බාධාවන්ද සැලකිය යුතු ගැටලුවකි. ජනතාව ගේ දේශීයත්වය පිළිබඳ ආකල්ප ඉවතලමින් වර්තමානයේ දී රටේ ප්‍රධාන සංවර්ධන අවශ්‍යතා ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක කිරිමට බලාපොරොත්තුවන බොහෝ කාර්යයන් දේශීය යථාර්ථයන්ට නොගැලපීමෙන් අසාර්ථක වී ඇත. එමෙන්ම ලාභදායි කාර්යක්ෂම පාරම්පරික දැනුම නොසලකමින් වියදම් අධික හා නොගැලපෙන තාක්ෂණය මත යැපීම නිසා සංවර්ධන ආධාර පවා අපතේ යෑමකට ලක් වී ඇත. මෙම තත්ත්වය කෘෂි, ආහාර, වෛද්‍ය, ධීවර ආදී සෑම ක්ෂේත්‍රයකට ම බලපා ඇත.

මෙම කරුණුවලින් ගම්‍ය වන්නේ දේශීය ජනතාවගේ ජීවන රටාව හා ඉතා සබැඳි පාරම්පරික දැනුම හා ව්‍යවහාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව වේ.

මෙම ප්‍රතිපත්තිය මඟින් වාණිජ අරමුණුවලින් බැහැරව මනුෂ්‍ය අවශ්‍යතා පදනම් කරගනිමින් පාරම්පරික දැනුම හා ව්‍යවහාර සඳහා භාවිතයට සුදුසු උපායමාර්ග නිර්මාණය කර ගත යුතු ය. පාරම්පරික දැනුම හා ව්‍යවහාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනයට සහාය වනු ඇත.

## 4. අභිමතාර්ථය

තිරසර සංවර්ධන රාමුව තුළ පාරම්පරික දැනුම හා ව්‍යවහාර සංරක්ෂණය කිරිම හා ඒ මගින් ස්වභාවික සම්පත් භාවිතය කළමනාකරණය කර දේශිය ජනතාව ගේ ජීවන රටාව නගා සිටුවීම සහතික කිරීම.

## 5. ප්‍රධාන මූලධර්ම

i. පාරම්පරික දැනුම පරම්පරාවෙන් පරම්පරාවට පැවත එන හා සමහර අවස්ථාවල මුල් ප්‍රභවය නිශ්චිත ව සොයාගත නොහැකි සම්පතක් බැවින් එය දේශීය ජනතාව නියෝජනය වන අදාළ සුවිශේෂ ජනකොටසේ හෝ සමස්තයක් වශයෙන් රටවැසියා සතු පොදු උරුමයක් සේ සැලකිය යුත්තේ ය.

ii. සෑම පුරවැසියකුට ම පාරම්පරික දැනුම හා ව්‍යවහාර තිරසර ආකාරයට භාවිත කිරීමේ අයිතිවාසිකම ඇති අතර, කිසිවෙකුටත් මෙම පාරම්පරික දැනුම හෝ පාරම්පරික දැනුම මඟින් භාවිත කරන සම්පත්, පරිහාණියට පත්කිරීමට සහ අනාගත පරම්පරාවට පාරම්පරික දැනුම භාවිතය වැළැක්වීමට අයිතියක් නැත්තේ ය.

iii. පාරම්පරික දැනුම හා ව්‍යවහාර ජීව සම්පත් භාවිතය පිණිස යොදනවිට එම සම්පත්වල භාවිතය ක්‍රමවත් හා තිරසර ආකාරයට සිදුවන බව හා එම භාවිතයන් පරිසර පද්ධති හා පරිණාමික ක්‍රියාවලි සමග එකඟතාවන් මත සිදුවන බව තහවුරු කළ යුත්තේ ය.

iv. පාරම්පරික දැනුම හා ව්‍යවහාර සංරක්ෂණය කිරීම පුළුල් ප්‍රජා සහභාගිත්වයකින් සිදු කළ යුත්තේ ය.

v. පාරම්පරික දැනුම හා ව්‍යවහාර සතු සුවිශේෂ පාරම්පරික වටිනාකම් හා සිරිත්විරිත්, දේශීය දැනුම දරන්නන් හා එය පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය කිරීමට උදව් වූවන් (ලිඛිතව හෝ වාචිකව) නිසි ආකාරයට අගය කිරීම, පිළිගැනීම හා ගරු කිරීම සිදු කළ යුත්තේ ය.

vi. පාරම්පරික දැනුම හා ව්‍යවහාර උචිත ක්‍රමවේද භාවිත කරමින් "ආරක්ෂිත ලේඛන ගත කිරීම" වැනි සුදුසු ක්‍රමයක් මගින් නොනැසී පවත්වාගෙන යා යුතු ය. එමෙන් ම පාරම්පරික දැනුම පිළිබඳ අයිතිවාසිකම් දැනුම දරන අදාළ පුද්ගලයාට, ජනතාවට හෝ රටවැසියන් ගේ පොදු සම්පතක් ලෙස ලබාදීම හා පාරම්පරික දැනුම භාවිතයෙන් ගොඩනැගෙන ප්‍රතිලාභ සමාන හා සාධාරණ ආකාරයට බෙදී යැම සිදුවිය යුත්තේ ය.

vii. පාරම්පරික දැනුම හා ව්‍යවහාර තිරසරව තත්කාලීන සංවර්ධන කාර්යයන් සඳහා යොදාගත යුත්තේ ය.

viii. පාරම්පරික දැනුම පිළිබඳ අධ්‍යයන, ගවේෂණ හා පර්යේෂණ සිදුකිරීම දිරිමත් කළ යුත්තේ ය.

## 6. ප්‍රතිපත්ති ප්‍රකාශ

i. සියලුම මට්ටම්වල දී, සහභාගිත්වය, පාරදෘශ්‍ය භාවය, හා වගකීම ඇතුළත් වූ තීරණ ගැනීමේ ක්‍රියාවලි මගින් පාරම්පරික දැනුම හා ව්‍යවහාර කළමනාකරණය හා භාවිතය (ආරක්ෂාව, සංරක්ෂණය හා තිරසර භාවිතය) සිදු කළ යුත්තේ ය.

ii. පාරම්පරික දැනුම සංරක්ෂණයේ ඇති ආර්ථික සමාජ හා පාරිසරික වැදගත්කම පිළිගත යුතු අතර, මෙම දැනුම තිරසර ලෙස භාවිතය ජනතාව ගේ අභිවෘද්ධිය පිණිස විය යුත්තේ ය.

iii. ධාරිතා වර්ධනය, නෛතික උපාංග හා වැඩිදියුණු කරන ලද අන්තර් ආයතනික සමායෝජනය හා ජාල ගත කිරීම හා තාක්ෂණික ක්‍රමවේද මගින් පාරම්පරික දැනුම හා ව්‍යවහාර සංරක්ෂණය සඳහා වූ ආයතනික රාමුව ශක්තිමත් කළ යුත්තේ ය.

iv. පාරම්පරික දැනුම හා ව්‍යවහාර අදාළ රාජ්‍ය - පුද්ගලික හා ප්‍රජා ක්‍රියාකරකම් හා ජාලගතවීම් සියලුම මට්ටම්වල දී ප්‍රවර්ධනය කළ යුත්තේ ය.

v. පාරම්පරික දැනුම හා ව්‍යවහාර පිළිබඳ අදාළ සියලුම පාර්ශ්වකරුවන්ගේ දැනුවත්වීම ඉහළ නැංවීම හා එහි භාවිතය සැලසුම්ගත අධ්‍යාපනය, ගවේෂණ හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම තුළින් සාක්ෂාත් කරගත යුත්තේ ය.

vi. පාරම්පරික දැනුම හා ව්‍යවහාරයන් සංරක්ෂණය හා තිරසර භාවිතය පිළිබඳ අන්තර් ජාතික බැඳීම්, අපගේ ජාතික හා කලාපීය බැඳීම්වල වගකීම් කොටසක් ලෙස ගරු කළ යුත්තේ ය.

vii. රටේ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා පාරම්පරික දැනුම සක්‍රීය ලෙසත්, ඵලදායක ලෙසත් යොදාගනු ලැබිය යුත්තේ ය.

## 7. ප්‍රතිපත්තියේ අරමුණු

i. පාරම්පරික දැනුම හා දැනුම සංචිතව පවතින ස්ථාන හා ප්‍රදේශ හඳුනාගැනීම, රැස්කිරීම, සංරක්ෂණය හා තිරසර භාවිතය ප්‍රවර්ධනය කිරීම.

ii. පාරම්පරික දැනුම හා ව්‍යවහාර භාවිතය මගින් ගොඩනැගෙන ප්‍රතිලාභ සමාන හා සාධාරණ ආකාරයට බෙදීයාමට සැලැස්වීම.

iii. පාරම්පරික දැනුම හා ව්‍යවහාර භාවිත කරන්නන්ට හා එහි භාරකාරයන්ට ගරු කිරීම, ප්‍රතිලාභ සැලසීම හා ඔවුනට අවශ්‍ය ආරක්ෂාව සැපයෙන වග තහවුරු කිරීම.

iv. පාරම්පරික දැනුම හා ව්‍යවහාර සංරක්ෂණයට හා භාවිතයට අදාළ ඉලක්කගත වැඩසටහන් සම්බන්ධීකරණය කොට ක්‍රියාත්මක කිරීම පහසු කරවනු සඳහා අවශ්‍ය ආයතනික රාමුව ගොඩනැගීම, නෛතික බලතල හා සම්පත් ලබාදීම.

v. පාරම්පරික දැනුමෙහි උපයෝගීතාව පිළිබඳ සමාජ ආර්ථික හා පාරිසරික වටිනාකම හඳුනාගැනීම.

vi. ශ්‍රී ලංකාවෙන් පිටතට නීත්‍යානුකූලව හා නීත්‍යානුකූල නොවන ලෙසින් ගලාගිය, දැනට මෙරට දී හමුනොවන පාරම්පරික දැනුම නැවත ලබාගැනීම හා රට තුළ ප්‍රතිස්ථාපනය කිරීම.

vii. ඉහත අරමුණු සාක්ෂාත් වන පරිදි හා දේශීය අනන්‍යයතාව ආරක්ෂාවන පරිදි ශ්‍රී ලංකාව දැනුම් කේන්ද්‍රයක් ලෙස පත්කිරීමට පාරම්පරික දැනුම යොදාගැනීම.

## 8. අදාළත්වය හා විෂය පථය

වර්තමාන හා අනාගත පරම්පරාවල ප්‍රයෝජනය සඳහා පුළුල් ජනතා සහභාගිත්වයක් ඇති ව පාරම්පරික දැනුම හා ව්‍යවහාර සංරක්ෂණය කිරීම හා දේශිය ජනතාව ගේ ජීවන තත්ත්වය එමගින් නඟා සිටුවීම උදෙසා හා ශ්‍රී ලංකාව දැනුම කේන්ද්‍රයක් බවට පත්කිරීමේ අරමුණ කෙරෙහි රජයෙහි කැපවීම, පාරම්පරික දැනුම හා ව්‍යවහාරයන් පිළිබඳ මෙම ජාතික ප්‍රතිපත්තිය මගින් තහවුරු කෙරේ.

දේශිය සංස්කෘතිය සුරැකීම, දේශිය ජනතාව ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සහ පාරම්පරික දැනුම හා ව්‍යවහාර සංරක්ෂණය කිරීම, අදාළ සියළුම රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන හා පුද්ගලයින් සතු බලවත් යුතුකමක් මෙන් ම වගකීමක් ද වන බව මෙම ප්‍රතිපත්තියෙන් අවධාරණය කරයි.

## 9. පාරම්පරික දැනුම හා ව්‍යවහාර සංරක්ෂණය, භාවිතය, හුවමාරුව සහ අනෙක් ක්‍රියාකාරකම් සඳහා උපාය මාර්ග

### 9.1 පාරම්පරික දැනුම හා ව්‍යවහාර සංරක්ෂණය පිළිබඳ පොදු උපාය මාර්ග

i. පාරම්පරික දැනුම හා ව්‍යවහාර සංරක්ෂණය කිරීම ජාතික අවශ්‍යතාවක් බව සියලු අංශ සඳහා අවබෝධ කරදීම හා ආංශික ප්‍රතිපත්ති හා සැලසුම්වලට පාරම්පරික දැනුම භාවිත කරන ක්‍රියාකාරකම් ඇතුළත් කිරීම.

ii. සුදුසු පොදු ක්‍රමවේදයක් භාවිත කරමින් ලේඛනගත කළ හැකි තත්ත්වයේ පවතින පාරම්පරික දැනුම හා ව්‍යවහාර ලේඛනගත කිරීම මගින් ඊට ආරක්ෂාව සැලසීම හා ලේඛන ගත නොවී පවතින දැනුම රැස්කර ආරක්ෂා කරලීම.

iii. පුළුල් වශයෙන් පාරම්පරික දැනුම හා ව්‍යවහාර සංචිතව පවතින ප්‍රදේශ හඳුනාගැනීම, එම ප්‍රදේශයන්ගේ පාරම්පරික දැනුම හා ව්‍යවහාර රැස්කිරීම, ආරක්ෂා කිරීම හා එම සුවිශේෂ ප්‍රදේශවල ගබඩාවී ඇති දැනුමට, ව්‍යවහාරයන්ට හා සංස්කෘතියට හානි පැමිණිය හැකි උචිත නොවන සංවර්ධන කටයුතු හැකිතාක් අවම කිරීම.

iv. වෙනත් රටවල පාරම්පරික දැනුම හා ව්‍යවහාර සහිත ජන කොට්ඨාශයන්ට අයත් දැනුම හා ව්‍යවහාර සංරක්ෂණය කර ඇති ආකාරය අධ්‍යයනය කිරීම මඟින් එම ක්‍රම මෙරටට ගැලපේද යන්න තීරණය කර, එම ක්‍රමවේද අපගේ පාරම්පරික දැනුම හා ව්‍යවහාර සංරක්ෂණය සඳහා යොදාගැනීම.

v. පාරම්පරික දැනුම හා ව්‍යවහාර සංරක්ෂණය, භාවිතය, අධ්‍යයනය, ගවේෂණය සහ ප්‍රවර්ධනය සඳහා සියලු පහසුකම් සහිත ජාතික මධ්‍යස්ථානයක් පිහිටුවීම.

vi. පාරම්පරික දැනුමේ පදනම වන ප්‍රාදේශීය භාෂා හා ජනවහර සංරක්ෂණය සඳහා භාෂා විද්‍යාගාර පිහිටුවීම.

vii. ප්‍රාදේශීය භාෂා හා ජනවහර සංරක්ෂණය සඳහා මධ්‍යම දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම.

viii. නීත්‍යානුකූලව හා නීත්‍යානුකූල නොවන ලෙසින් ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙනගිය පාරම්පරික දැනුමට අදාළ සම්පත් හා මූලාශ්‍ර නැවත ලබාගැනීම හා රටතුළ ප්‍රතිස්ථාපනය කිරීමට ශ්‍රී ලංකාවේ විදේශ සේවාව උපයෝගීකරගෙන කටයුතු කිරීම.

### 9.2 පාරම්පරික දැනුම හා ව්‍යවහාර භාවිතය පිළිබඳ උපාය මාර්ග

i. යම් ප්‍රදේශයක දියත්කරන වැඩසටහනක් සංවර්ධන ව්‍යාපෘතියක් හෝ පරිසරයට, ආර්ථිකයට, සමාජ සංස්කෘතියට සම්බන්ධවන ඕනෑම රාජ්‍යය හෝ පෞද්ගලික අංශයේ කටයුත්තක දී ප්‍රදේශයේ පවතින, අදාළ කරුණු සම්බන්ධ පාරම්පරික දැනුම හා ව්‍යවහාරයන්හි වලංගුභාවය පිළිගැනීම, භාවිතය හා ප්‍රචලිත කිරීම.

ii. යම් වැඩසටහනක් හෝ ව්‍යාපෘතියක් සැලසුම් කිරීමට පෙර අදාළ විෂය පථයේ පාරම්පරික දැනුම හා ව්‍යවහාර පිළිබඳ නිපුණයන් ගේ දැනුම් සම්භාරය, බලපෑම් තක්සේරු වාර්තා සහ අනෙකුත් වාර්තා පිළියෙල කිරීම සඳහා ලබාගැනීම සහ ඒවාට අනුකූලව කටයුතු කිරීම. මෙහි දී තත්කාලීන නීතියට අනුව කටයුතු කරමින් පාරම්පරික දැනුම හා ව්‍යවහාර පිළිබඳව සලකා බලන ලද පාරිසරික බලපෑම් තක්සේරු වාර්තා සහ වෙනත් වාර්තා ලබාගැනීමට කටයුතු කිරීම.

iii. යම් ස්ථානයක, ප්‍රදේශයක පාරම්පරික දැනුම හා ව්‍යවහාර භාවිත කරන ව්‍යාපෘතිවලට අවශ්‍ය පහසුකම් සැලැස්වීම සහ පාරම්පරික දැනුම හා ව්‍යවහාර භාවිතයට පවතින බාධා ඉවත් කිරීම.

iv. පාරම්පරික දැනුම හා ව්‍යවහාර භාවිතයට ජනතා සහභාගීත්වය ලබාගැනීම, අවශ්‍යවන අමුද්‍රව්‍ය හා සම්පත් සුලභ කිරීම, ඒ සඳහා ප්‍රතිපාදන හා පුහුණු පහසුකම් සැපයීම හා රාජ්‍ය මට්ටමේ දිරිගැන්වීම් ලබාදීම.

## 9.3 පාරම්පරික දැනුම හා ව්‍යවහාර හුවමාරු කරගැනීම පිළිබඳ උපාය මාර්ග

i. විවිධ ජනකොටස් අතර, විවිධ ප්‍රදේශ අතර පවතින පාරම්පරික දැනුම හා ව්‍යවහාර අභාවයට යාම වළක්වාගැනීමේ පරමාර්ථයෙන් සහ තිරසර සංවර්ධනයේ අභිමතාර්ථ සපුරා ගැනීම සඳහා ද පාරම්පරික දැනුම දේශය තුළ හා දේශයන් අතර හුවමාරු කරගැනීම සඳහා දිගුකාලීන වැඩසටහන් සම්පාදනය කිරීම.

ii. පාරම්පරික දැනුම හා ව්‍යවහාර හුවමාරුව මුවාවෙන් ඒවා සොරාගැනීම හා එයින් රටට හා ඒවා දරන්නන්ට අහිතකර ලෙස බලපෑමට ඇති ඉඩකඩ අසුරාලීම සඳහා විශේෂයෙන්ම බුද්ධිමය දේපල නීතිය අවශ්‍ය ආකාරයට සංශෝධනයකර ක්‍රියාත්මක කිරීම.

iii. පාරම්පරික දැනුම හා ව්‍යවහාර පිළිබඳ ව වර්තමාන ප්‍රභවය දරන්නා ගේ හෝ දරන්නන් ගේ අයිතීන් සුරැකෙන ලෙස අදාල පාරම්පරික දැනුම හා ව්‍යවහාර භාවිත කළයුතු අතර වර්තමාන ප්‍රභවය දරන්නා ගේ අයිතිය මුල්තැනෙහිලා සැලකීම මගින් හුවමාරුව ප්‍රවර්ධනය කිරීම.

iv. පාරම්පරික දැනුම හා ව්‍යවහාරයන් විදේශීය භාවිතයන් සඳහා යොදාගන්නා සෑම අවස්ථාවක දී ම අදාළ දැනුමේ හා ව්‍යවහාරයන් ගේ අයිතිය ශ්‍රී ලංකාවට රඳවාගැනීම සඳහා නීතිමය තත්ත්වය ශක්තිමත්ව පවත්වා ගැනීම සහ අදාළ දැනුම හා ව්‍යවහාර ශ්‍රී ලංකාව සතු සම්පතක් ලෙස සැලකීමට කටයුතු සම්පාදනය කිරීම.

## 9.4 පාරම්පරික දැනුමෙන් හා ව්‍යවහාර මගින් ජනනය වන ප්‍රතිලාභ භාවිතය පිළිබඳ උපාය මාර්ග

i. පාරම්පරික දැනුම හා ව්‍යවහාර මගින් ජනනය වන ප්‍රතිලාභ සෑම විටම අදාළ සියලු පාර්ශ්ව හා ජන කොටස් අතර සමානව හා සාධාරණව බෙදා හැරීමට යාන්ත්‍රණයක් සැකසීම.

ii. පාරම්පරික දැනුම හා ව්‍යවහාර මගින් ලැබෙන ප්‍රතිලාභ ජාතික වත්කමක් ලෙස සලකා කටයුතු කිරීම හා ජාතික මට්ටමේ වටිනාකමක් එයට ලබාදීම.

iii. පාරම්පරික දැනුම හා ව්‍යවහාර මගින් ජනනය වන ප්‍රතිලාභ දිගින් දිගටම නොනවත්වා සකසන ලද යාන්ත්‍රණය ඔස්සේ ම ගමන්කරන්නේ දැයි සොයා බැලීම සඳහා පසු විපරම් කටයුතු සම්පාදනය කිරීම.

iv. පාරම්පරික දැනුම හා ව්‍යවහාර යොදාගැනීමෙන් ජනනය වන ප්‍රතිලාභ අදාළ ජන කොටසට භාවිතා කළ හැකි ප්‍රවේශ වියහැකි ප්‍රතිලාභ බවට පත්කිරීම.

v. පාරම්පරික දැනුම හා ව්‍යවහාර මගින් ජනනය වන ප්‍රතිලාභ අදාළ දේශීය ජනතාවට ලබාදීම පිණිස අවශ්‍ය අවස්ථාවල දී රාජ්‍ය මැදිහත්වීමක් සිදු කිරීම.

vi. පාරම්පරික දැනුම හා ව්‍යවහාර මගින් ගොඩනැගෙන මූල්‍යමය ප්‍රතිලාභ අදාළ ජන කොටසේ සංස්කෘතියට, දේශීය සම්පත්වලට හා පාරම්පරික දැනුම සංරක්ෂණය කෙරෙහි අහිතකර ලෙස බලපාන අවස්ථාවක දී ඒවා මගහැරීම සඳහා රාජ්‍ය මැදිහත්වීමකින් සුදුසු සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

### 9.5 පාරම්පරික දැනුම හා ව්‍යවහාර තිරසර භාවිතය සහ සංරක්ෂණය පිළිබඳ ආයතනික උපාය මාර්ග

i. පාරම්පරික දැනුමේ හා ව්‍යවහාරයන්ගේ සුරක්ෂිතභාවය, එහි භාවිතය හා ප්‍රතිලාභ සමානව හා සාධාරණව බෙදීයාම පිළිබඳ වගකීම ආයතනගත කිරීමට කටයුතු කිරීම.

ii. පාරම්පරික දැනුම හා ව්‍යවහාර පිළිබඳ වාචික, ලිඛිත, ශ්‍රව්‍ය දෘෂ්‍ය හා වෙනත් තොරතුරු පවත්වා ගැනීම, යාවත්කාලීන කිරීම හා කළමනාකරණය ආයතනගත කිරීමට කටයුතු කිරීම.

### 9.6 පාරම්පරික දැනුම හා ව්‍යවහාර සංරක්ෂණය හා තිරසර භාවිතය පිළිබඳ සමාජයීය හා ආර්ථිකමය උපාය මාර්ග

i. පාරම්පරික දැනුම දරන්නන් සමාජයේ වැදගත් හා සම්මානනීය පුද්ගලයන් ලෙස සැලකීම හා සමාජ ආර්ථික කටයුතුවල දී ඔවුන්ගේ දායකත්වය ලබාගැනීම.

ii. පාරම්පරික දැනුම දරන්නන් සඳහා ජාතිකමය මට්ටමේ දිරිගැන්වීම් හෝ ඇගයීම් ක්‍රමයක් සැකසීම.

iii. සංස්කෘතිමය අංග සඳහා පාරම්පරික දැනුම හා ව්‍යවහාරයන් යොදාගැනීම ප්‍රචලිත කරවීම හා ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබාගැනීමේ ක්‍රමවේදයක් සකස් කිරීම.

iv. එක් එක් සුවිශේෂ ක්ෂේත්‍රවල පාරම්පරික දැනුම දරන්නන් සඳහා සුහසාධන ක්‍රම හා ඒවා දිරිගැන්වීමේ ක්‍රම ක්‍රියාත්මක කරවීම. දේශීය දැනුම දරන යම් සුවිශේෂී ජන කොට්ඨාශ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම හා ඔවුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට කටයුතු කිරීම.

v. පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය වන පාරම්පරික දැනුම හා ව්‍යවහාර අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා පාරම්පරික දැනුම දරන්නන් පෙළඹවීම හා දැනුම ලබාගැනීමට තරුණ පරම්පරාව පෙළඹවීම පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

vi. පාරම්පරික දැනුම හා ව්‍යවහාර පිළිබඳ වටිනාකම් ඇගයීම හා ජාතික ක්‍රම සම්පාදන සැලසුම්වලට සහ ජාතික ආදායමට එම වටිනාකම් ඇතුළත් කිරීමට කටයුතු කිරීම.

vii. යම් ව්‍යාපෘතියක් හෝ කාර්යයක් මගින් පාරම්පරික දැනුම දරන ජන කොට්ඨාශයන් හා සංස්කෘතීන් විනාශයට ලක්වන්නේනම් එය වැළැක්වීම හෝ විනාශය අවම කිරීමට කටයුතු කිරීම.

viii. යම් පුද්ගලයෙක් හෝ ජනකොට්ඨාසයක් හෝ පාරම්පරික දැනුම යොදාගෙන වාණිජමය වශයෙන් හා ආර්ථිකමය ලෙස වැදගත් වන පරිසර හිතකාමී ලෙස නවෝත්පාදන වල යෙදේ නම් ඒවා දිරිගැන්වීම හා පහසුකම් සැපයීම .

ix. යම් ආයතනයක් මගින් කුමන හෝ ආකාරයකට පාරම්පරික දැනුමට අදාළව රැස්කර ඇති තොරතුරුවල පිටපතක් යෝජිත ජාතික මධ්‍යස්ථානයේ තැන්පත් කිරීමට කටයුතුකිරිම.

## 9.7 පාරම්පරික දැනුම හා ව්‍යවහාර පිළිබඳ අධ්‍යාපනය හා එහි ප්‍රවර්ධනය පිළිබඳ උපාය මාර්ග

i. පාරම්පරික දැනුම හා ව්‍යවහාර භාවිතා කරන ප්‍රදේශ, ජනකොටස් හා අදාළ දැනුම පිළිබඳ අධ්‍යාපනයක් ඉදිරි පරම්පරා සඳහා ලබාදීම පිණිස ආකල්ප වර්ධනය කිරීමට කටයුතු කිරීම.

ii. පාරම්පරික දැනුම හා ව්‍යවහාර සම්බන්ධ ප්‍රධාන ආයතන දැනුවත් කිරීමේ අංශයක් යෝජිත ජාතික මධ්‍යස්ථානය තුළ ස්ථාපිත කිරීම හා එයට අදාළ පහසුකම් සපයාදීම.

iii. පාරම්පරික දැනුම හා ව්‍යවහාර සහ ඒවා භාවිතයේ ප්‍රයෝජන පිළිබඳ ඥාන අන්තර්ගතයක් පාසැල් විෂයමාලා සහ පෙළපොත්වලට සහ විශ්වවිද්‍යාල උපාධි, පශ්චාත් උපාධි, ඩිප්ලෝමා පාඨමාලා සඳහා ඇතුළත් කරවීම හා පාරම්පරික දැනුම හා ව්‍යවහාර පාසල් හා උසස් අධ්‍යාපන ආයතනවල විෂයයක් ලෙස ස්ථාපිත කිරීම සඳහා අදාළ ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

iv. පාරම්පරික දැනුම හා ව්‍යවහාර සම්බන්ධව අධ්‍යාපන ක්ෂෙත්‍රයේ නියැලෙන ගුරුභවතුන්, ආචාර්යවරුන් අධ්‍යාපන නිලධාරීන් හා උපදේශකවරුන් ආදීන් දැනුවත් කරලීම.

v. පාරම්පරික දැනුම හා ව්‍යවහාර සම්බන්ධ ව පාසල් ව්‍යාපෘති ඇරඹීම සඳහා පාසැල් සිසුන් පෙළඹවීම.

vi. දීප ව්‍යාප්ත මට්ටමින් පාරම්පරික දැනුම, ව්‍යවහාර හා එහි වටිනාකම සහ සංරක්ෂණයේ අවශ්‍යතාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ව්‍යාප්ත කිරීම.

vii. ජනමාධ්‍ය ආයතන මගින් පාරම්පරික දැනුම හා ව්‍යවහාර පිළිබඳ ප්‍රවර්ධන වැඩසටහන් ප්‍රචාරය කරවීම, පර්යේෂණ සිදුකිරීම, පහසුකම් සැපයීම හා ඒ සඳහා ජන සහභාගීත්වය ලබාගැනීමට ක්‍රමවේද සකස් කිරීම.

viii. පාරම්පරික දැනුම හා ව්‍යවහාර සම්බන්ධව පවතින ග්‍රන්ථ හා වෙනත් ප්‍රකාශන සුලභ කරලීම හා පිළිගත් පුස්තකාල සඳහා එම ප්‍රකාශණ ලබාදීමට කටයුතු කිරීම හා මෙම ප්‍රකාශන නිර්මාණය සඳහා කතුවරුනට පහසුකම් සලසාදීම සහ දිරිමත් කිරීම.

ix. විශ්වවිද්‍යාල පශ්චාත් උපාධි මට්ටමෙන් පාරම්පරික දැනුම හා සම්බන්ධ පර්යේෂණ සඳහා දේශීය මෙන් ම විදේශීය පර්යේෂකයන් දිරිමත් කිරීම.

x. පාරම්පරික දැනුම හා ව්‍යවහාර පිළිබඳ පර්යේෂණ හා අනෙකුත් අධ්‍යයන සහ පාරම්පරික දැනුම දරන්නන් ගේ කාර්යභාරය ඇගයීම පිණිස වාර්ෂික සම්මන්ත්‍රණ පැවැත්වීම සහ සම්මාන ප්‍රදානය

## 9.8 පාරම්පරික දැනුම හා ව්‍යවහාරයන්ගේ නෛතික ආරක්ෂාව පිළිබඳ උපාය මාර්ග

i. පාරම්පරික දැනුම දරන්නන් හා ඔවුන් ගේ බුද්ධිමය දේපළ අයිතිය සුරැකීමට නීතිමය ප්‍රතිපාදන සැලසීම.

ii. පාරම්පරික දැනුම හා ව්‍යවහාර පරිසරයට හිතකර මෙන් ම අහිතකර ලෙස ද යොදාගතහැකි බැවින් එම දැනුම හා ව්‍යවහාර පරිසරයේ පුනර්ජනන මට්ටම නොඉක්මවන සේ තිරසර ලෙස භාවිතය සඳහා නීතියෙන් පහසුකම් සැපයීම.

iii. පාරම්පරික දැනුම හා ව්‍යවහාර වල ආරක්ෂාව සඳහා නීතිමය රැකවරණය සැලසීම ජාතික අවශ්‍යතාවයන් ලෙස වටහා ගෙන එය ක්‍රියාත්මක කිරීම.

iv. පාරම්පරික දැනුම දරන්නන් ගෙන් එම දැනුම හා ව්‍යවහාර අයථා ලෙස ලබාගැනීම ඇතුළුව පාරම්පරික දැනුම හා ව්‍යවහාර අවභාවිතය, සොරා ගැනීම, අනර්ථකාරී ලෙස යොදාගැනීම යනාදිය නැවැත්වීමට නීතිමය ප්‍රතිපාදන සැකසීම.

v. පාරම්පරික දැනුම හා ව්‍යවහාර යොදාගැනීම මගින් ජනනය වන ප්‍රතිලාභ සියලූ ජනකොටස් අතර සමානව හා සාධාරණව බෙදාහැරීමට අවශ්‍ය නීතිමය තත්ත්වයන් සැකසීම සහ එහි අධීක්ෂණයට නෛතික ක්‍රමවේදයක් සැකසීම.

vi. පාරම්පරික දැනුම හා ව්‍යවහාර සංරක්ෂණයට අදාළ අනෙකුත් අණ පනත් යාවත්කාලීන කිරීම, පාරම්පරික දැනුමට අදාළ වෙනත් අන්තර්ජාතික සම්මුති, ප්‍රඥප්ති හා ප්‍රකාශන ඇතුළත් කිරීම හා පාරම්පරික දැනුම හා ව්‍යවහාරයන් සංරක්ෂණය හා භාවිතය පිළිබඳ වගන්ති, රෙගුලාසි එයට ඇතුලත් කිරීම.

vii. පාරම්පරික දැනුම සංරක්ෂණයට අදාලව දැනට පවතින නීති රෙගුලාසි අවශ්‍යතාව මත සංශෝධනය කිරීමට කටයුතු කිරීම.